රාජ්‍ය දූරාචාරය.

# ලංකා මාතාව දරිද්‍රතාවයේ උග්‍ර පතුලට.




ලංකාවේ පුරවැසියන් මේවන විට ඉතාම දුගී දුප්පත් භාවයට තල්ලු වෙලා තියෙනවා. ගෝලීය සාගිනි දර්ශකයේ 60 වන තැනට මේවන වීට ලංකාව පත්වෙලා තියෙනවා. පසුගිය 2021 වර්ෂයේ 65 වන ස්ථානයේ ලංකාව සාගිනි දශකයේ පසුවුනා. ඒ රටවල් 110 ක් අතරින් ,2022 රටවල් 121 අතරින් 64 වන ස්ථානයට මධ්‍යස්ථ වශයෙන් සැලකිය හැකි වුවත්, ලංකාවේ සැබෑ සාගිනි තත්වය උග්‍රවෙමින් තිබියදී ජනාධිපති උපදේශක සුරේන් බටගොඩගේ ප්‍රකාශය පසුගිය කාලය තුලදි විවාදයට පමණක් සීමා වුවා. මේ තත්වය උග්‍රවෙන්නේ කොහොමද?

දැනට යෝජනා වී තිබෙන දූෂණ විරෝධි කොමිෂමක් යටතේ ලංකාවේ සිදුවන දූෂණ ක්‍රියාකාරකම් වසාදමන්න හැකියාවක් කාර්යාභාරයක් ලංකාවේ දේශපාලන අධිකාරියට ඉක්මන් උවමනාවක් නැතිකම ඉතාම ගැටලු සහගත තත්වයක් . 2014 වසරේදී කොළඹ වරායට ගෙනැවිත් තිබූ හාල් ටොන් ගණනක් දිරා පත්වීමට අත්හැර දමා තිබුණා. ඒ නිසා කෝටි 1500 ක එහෙම නැත්නම් බිලියන 15 ක පාඩුවක් සිදුවි තිබෙන බවට විගණනයේදී හෙලිවී තිබුණා. නමුත් මේවන තුරු අදාළ පාර්ශව වලට එරෙහිව පියවර ගැනීමට පැවති රජය හා වර්තමාන රජයත් කාර්යක්ෂම කාර්යභාරයක් නැතිවී තිබෙන තැනක ලංකාව නැවත නැවත දුගී දුප්පත් භාවයට සීඝ්‍රව තල්ලු වන තත්වයකට ගොදුරුවී තියෙනවා.

ඊට තවත් සාධක වශයෙන් පෙන්වනවානම් කෝප් කමිටු වල හිටපු සභාපතිවරුන් වන සුනිල් හඳුන්නෙත්ති හා චරිත හේරත් වැනි මන්ත්‍රිවරු විගණන වාර්තා මගින් පෙන්වා දී ඇති කරුණු පිළිබඳ වලින් යම් යම් සාධනීය පියවර ගත්තත්, කිසිම අයෙකුට දඬුවම් දීමක් හෝ එහෙම නැත්තම් අධිභාර පැනවීමක් මෙතෙක් සිදුකර නැහැ. ඊට ප්‍රධාන හේතුව වී තිබෙන්නේ මුදල් අයකර ගැනීමට හෝ දඬුවම් පැනවීමට අවශ්‍ය නෛතික බලයක් කෙටුම්පත් කර පාර්ලිමේන්තුවෙන් අනුමත කර ගැනීමට මේ ලාකංවේ දූෂිත දේශපාලන අධිකාරි සහමූලික ප්‍රයත්නයක් මෙතෙක් දරා නැතිකම.

මේනිසා රජයේ විගණනයත් ශත පහකටවත් වැඩක් නැති හුදෙක් ලියවිල්ලක් බවට පත්වි තිබෙනවා. එහෙමනම් විගණන බලධාරින් සඳහා ගෙවන වැටුප් අධික මුදලක් කුණු කාණු දිගේ සේදි යන

තත්වයකට පත්ව තිබෙනවා. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් පිහිටවු ජාතික විගණන සේවා කොමිෂම 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් අහෝසි කිරීම මීට ප්‍රධාන බලවත් සාධකයක්. මේවන විට 22 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුමත වෙලා තියෙනවා. ඇත්තටම ඒ සඳහා කඩිනම් පියවර සඳහා ආණ්ඩු පක්ෂයේ හෝ විපක්ෂය ජාතික විගණන සේවා කොමිෂම යළිත් බලගැන්වීම සිදුකිරීමට උනන්දුවක් දක්වන බවක් පේන්නේ නැහැ.

විගණකාධිපති වරයා විසින් සිදුකරන විගණන වාර්තා මේනිසා රටක එළදායි නොවන තත්වයක් මතුවෙමින් තියෙනවා. මීට අමතරව ගෝඨාභය රාජපක්ෂ ජනාපධිවරයාගේ කාලයේදී රුපියල් කෝටි 1400 ක් සීනි වංචාවෙන් සිදුවු බව අදාළ වාර්තා පෙන්වා දී තිබෙනවා. චින පොහොර නැව වෙනුවෙන් ගෙවු ඩොලර් මිලියන 6. 5 ක් මුදල ආපසු අයකරගත යුතු බවට විගණන වාර්තා මගින් පෙන්වා තිබුණත් ඉන් එහාට කිසිදු පියවරක් ගෙන නැතැයි අදාළ විගණන නිලධාරින් පවසනවා. ඊට අදාළ පාර්ශව සඳහා අධිකරණමය ක්‍රියාමාර්ග ගැනීමටත් රජය සහ විපක්ෂය අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග සදහා ප්‍රජාව උනන්දු කිරීම සහ ඒ සඳහා පාර්ලමේනතුවේ බලගැන්වීම් සඳහා ගන්නා උත්සාහයක් තියෙන්නේ ඉතාම අවතක්සේරු තත්වයක.

පාර්ලිමේනතු කෝප් සහ කෝපා කමිටු මගින් විගණන වාර්තා පදනම් කරගෙන නිලධාරීන් ගෙන්වා ප්‍රශ්න කිරීම හා එය ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය වලින් ප්‍රදර්ශනය කිරීම දිගින් දිගටම, සිදුවෙනවා. නමුත් කිසිම නිලධාරියෙකුට එරෙහිව අධිභාර පැනවීමට හෝ නොහැකිව ඇත්තේ ජාතික විගණන කොමිෂම අහෝසි කිරීම නිසා බව අදාළ මේ රටේ විශ්ව විද්‍යාල ප්‍රජාව හෝ බුද්ධිමත් ප්‍රජාව ඊට විරෝධතා හා සමාජ කථිකා නොකිරීම තවත් අඩුපාඩුවක්. මේ නිසා රටේ දූෂණ වංචා මූල්‍ය අක්‍රමිකතා හා දූෂිත ගනුදෙනු නතර කිරීමට නම් ජතික විගණන සේවා කොමිෂම ස්ථාපිත කොට දඩුවම් දිය හැකි ලෙස එය බලගැන්වීම කළ යුතු බව ජනාධිපතිවරයාගේ සිට සියලු මන්ත්‍රිවරු, ඇමතිවරු විපක්ෂයේ මන්ත්‍රිවරු තේරුම් ගත යුතුයි. දූෂණ ක්‍රියාකාරකම් වලට අත්අඩංගුවට ගන්නා අය පැය 24 ක් රඳවා තබා ගැනීමට අත්අඩංගුවට ගැනීමේ බාර නිලධාරින්ට හැකියාව ලැබෙන දූෂණ විරෝධි කොමිෂමක් බිහිකිරීමට ක්‍රියාකරන බව රජය පසුගියදා ප්‍රකාශ කළත් ,ඒ සඳහා අවශ්‍ය විධිමත් පියවර මෙතෙක් ගෙන නැහැ. ඒනිසා රට නැවත නැවත අයුතු තත්වයකට, අයුතු සමාජ ආර්ථික සංස්කෘතියකට, තල්ලුවෙමින් තිබෙනවා. මෙවැනි පරිසරයක් තුළ ස්වාභාවික විපත් රටතුල ගොඩනැගෙමින් තියෙනවා.

පසුගිය ඔක්තෝබර් අවසන් සතියත්, නොවැම්බර් මුල් දෙසතියත්, ඇතුළත දිස්ත්‍රික්ක 12 කට බලපා ඇති අයහපත් කාලගුණික තත්වය හේතුවෙන් මේවන විට පවුල් 14309ක ට අයත් පුද්ගලයින් 56630 ක් පීඩාවට පත්වී තිබෙන බව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පසුගියදා පවසා තිබුණා. එමෙන්ම මේවන විට ආරක්ෂික ස්ථාන 36ක පවුල් 1660 කට අයත් පුද්ගලයින් 5383 ක රැදී සිටින බවද වැඩිදුරටත් මධ්‍යස්ථානයෙන් ප්‍රකාශ වූවා. ගංවතුරට හසුවීමෙන් හා කඳු නායයෑම් හේතුවෙන් මේවන විට 5 දෙනෙක් මියගොස් තිබෙනවා.

ඇත්තමට මෙවැනි තත්වයක් වර්ධණය වෙන්නේ කුමන සමාජ පරිසරයත් තුළද? නියමිත ආර්ථික සමාජීය සංස්කෘතික වටපිටාව ස්ථාපිත කිරීම හා භෞතිත සංවර්ධනයේ දී ඊට අවශ්‍ය විකල්ප ක්‍රියාමාර්ග ගැනීමට පැවති හා වර්තමාන රජය අසමත්වීම. දේශගුණික විපර්යාස බොහෝවිට රටතුළ සිදුවෙමින් වාර්ෂිකව එය නොනවත්වා ක්‍රියාත්මක වෙමින් යන සමාජ පරිසරයක් තුළ ලංකාවේ ජනාධිපති රනිල් වික්‍රමසිංහ දේශගුණික අන්තර්ජාතික විපර්යාස පිළිබඳ සම්මන්ත්‍රණයකට ශ්‍රී ලංකාවේ බදු ගෙවන ජනතාවගේ මුදලින් ගිහිල්ලා තිබෙනවා. ඒ සඳහා පැහැදිලිවම ලංකාවේ ආපදා කළමනාකරණ පිළිබඳව

අදාල අමාත්‍යවරයා හෝ බලධාරින් රැගෙන ගොස් නැහැ. මේ සඳහා  වෙනත් රටක එනම් මාලදිවයින් කථානායක වරයාව රැගෙන ගොස් තිබෙනවා. මේ පිළිබඳ පුළුල් විග්‍රහයක් පසුව බලාපොරොත්තු වන්න.

ශ්‍රී ලංකාවේ ජනාධිපති වරුන්ගේ සිට සාමාන්‍ය මන්ත්‍රිවරයා දක්වාත්,  පලාත් 'සභා හා නගර සභාවලත් දූෂණ ක්‍රියාකාරකම් වලට එරෙහිව ආපු සමාජ සංස්කෘතිය 2013 දී යහපත් කිරීමේ ඉලක්කයක් තුළ සාධාරණ සමාජයක් සඳහා වන  ජාතික ව්‍යාපාරය බිහිවුනා. ඉන්පසුව සාධාරණ සමාජයක් සඳහා වන ජතික ව්‍යාපාරය විසින් ගොඩනැගුනු  ජනාධිපතිවරකුද බිහිවුනා.  නමුත් එය හුදෙක්ම  රටේ තවදුරටත් ඉච්චාභංගත්වය රැගෙන ගියා පමණයි. රටේ සමාජ සාධාරණත්වය උදෙසා යුක්තිය නීතිගරුක සාධාරණ සමාජයක් ඉල්ලලා තමයි මේ  ව්‍යාපාරය ගොඩනැගුනේ. ඒ සඳහා සමාජයේ  සම්පත් සාධාරණ ලෙස බෙදී යායුතු බව අදාළ ව්‍යාපාරයේ මතය වුනා. රටේ කළමනාකාරිත්වය සිදු නොවීම නිසා මෙවැනි ව්‍යාපාරයක අවශ්‍යතාවය ගොඩනැගුනා. ඒ කාලයේදී 18 වන ව්‍යවස්ථා සංශෝධනය බලාත්මක වෙමින් තිබුණා. මේ කාල පරිච්ඡේදයේ දි රටේ ජනාධිපතිවරයා වූයේ මහින්ද  රාජපක්ෂ ඇතුලු පාදඩ දේශපාන නඩයයි.

මේ රටේ  ප්‍රජාතන්ත්‍රවාදය ඒවන විට ඝාතනය වෙලා තිබුණා. ඒ නිසා තමයි සෝභිත හිමියන් එළියට ඇවිල්ලා ඉල්ලීමක් කළේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්න තියලා. ඒ වගේම ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කරන විධායක ජනාධිපති ධූරය අහෝසි කරන්න කියලා  ජනවරමක් ලබාදෙන ලෙස  උන්වහන්සේ ඉල්ලා සිටියා. ඒ අනුව 2015 දී ලංකාවට යම් ජනවරමක් ලැබුනා. ඒත් සමගම රාජ්‍ය පරිපාලනයේ යම් සංශෝධන ඇතිකිරීමට හැකියාව ලැබුනා. ඒ හරහා  රටේ ප්‍රජතන්ත්‍රවාදය යම් දුරකට ස්ථාපිත වුනා. ඇත්තටම එය විධිමත් වූවාද? ඒවගේම ආර්ථිකයේත් සුළු  දියුණුවක් ඇතිවුනා. ඊට පසු ගෝඨාභය ජනාධිපතිවරයාට මේ රටේ නැවත ජනවරමක් ලැබුණා. රට හදන්න බලය ඕන කියලා  තමයි එතුමා 20 වන ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවේ. ඒ මගින් නැවතත් රටේ ප්‍රජතන්ත්‍රවාදය හැකුලුනා .

20 සංශෝධනය ගෙනාවත් පාර්ලිමේන්තුවේ 3/2 බලයක් ලැබුණත් රටේ ප්‍රශ්න වලට  සැබෑ පිළිතුරු දෙන්න ඔවුන් අසමත් වුනා.  රටක ප්‍රජාතන්වාදය විනාශ කරන්නේ විධායක අප්‍රමාන බලයක් ඇති ජනාධිපතිවරයෙක් හරහා. ඒ දේ නැවත නැවතත් ශ්‍රී ලංකාව තුළ සිදුවීම ඉතාම  කණගාටුවට කරුණක්. එදා සිට අද දක්වා කාලයේදී රටේ විශාල පිරිහීමක් ඇතිවුනා. ඒ පිරිහීම ආර්ථිකමය කෘෂිකර්මාන්ත වශයෙන් පැහැදිලි බිඳවැටීමක්. අදටත් ප්‍රදර්ශනය වෙමින් තිබෙනවා.

පොහොර සම්බන්ධයෙන් ගත් තීන්දුව මුල්‍ය කළමනාකාරිත්වයේ දී වෘත්තිය භාවයකින් යුතුව කටයුතු කරන බවක්  රටට පෙනුනේ නැහැ. අවසානයේදී රට බලංකොලොත් භාවයවට තල්ලු වුනා. දර්ශනයක් ඇතිව පරිපාලන කළමනාකරණය කරනවානම් රටක මෙහෙම වෙන්න පුලුවන්ද?

1991 වන විට ඉංදියාවේ ආර්ථිකයේ තිබූ මුදල් ප්‍රමාණවත් වුනේ මාස  භාගයකට රට පවත්වාගෙන යන්න විතරයි. ඒත්  එවකට හිටිය අගමැති නරසිහංරාවෝ ආචාර්ය මන්මෝහන්සිං මහතා මුදල් ඇමති ධූරයට පත් කරමින් යම් යම් ප්‍රතිසංස්කරන අතිකරලා ආර්ථිකය  ගොඩගත්තා . නමුත්, ලංකාවේ මුදල් අමාත්‍ය ධූරය දරපු රවි කරණානායකට ලෝකයේ හොඳම මුදල් ඇමතියා බවට සහතික පත් අන්තර්ජාතිකව  ලැබුණා. නමුත් සැබෑ යථාර්ථය කුමක්ද? සැබෑ යථාර්ථය නම්, එක්සත් ජාතික පක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රි  රවි කරුණානායක මේ රට අගාදයෙන් අගාදයට අරගෙන යන්න ගත්තු ක්‍රියාමාර්ග වල ප්‍රතිඵල අදත් කාන්දුවෙලා තියෙනවා. මේ තත්වය පිළිබඳව වඩාත් පුළුල් විග්‍රහයක් අපි  ඉදිරි කාලයයේදී කථා කරන්න බලාපොරොත්තු වෙනවා.

ජාත්‍යන්තර මුල්‍ය අරමුදලට යන්න එදා ගෝඨාභය රාජපක්ෂ යටතේ සිටි මහ බැංකු අධිපති කබ්රාල් පසුගාමී තත්වයක හිටියා. අද ලෝකයේ තියෙන ලොකුම රාජ්‍ය සේවය තියෙන්නේ ලංකාවේ. ලෝකයේ අනිත් රටවල පුරවැසියන් 250 කට ඉන්නේ එක රාජ්‍ය සේවකයයි. ඒත් ලංකාවේ සෑම 14 දෙනෙකුටම එක රාජ්‍ය සේවකයෙක් ඉන්නවා. රාජ්‍ය සේවකයා ඉවත් කළයුතු කියලා නමුත් රාජ්‍ය සේවකයාගේ සේවය ඵළදායි කරන්න න්‍යාමනයවන ව්‍යවස්ථාපිත සැලසුම් රටාවක් රටතුළ නැතිකම ප්‍රධාන සාධකයක්. ඒ නිසා රට විනාශකරන පිරිස අතර ලංකාවේ රාජ්‍ය සේවය් දූෂිත නිලධාරින්ගේ පැවැත්ම රටට ඉතාමත් හානිකර තත්වයවක් උදාකරලා තියෙනවා. ඒ නිසා රට තුළ අවසානයේ දී වසර 74 ක් පුරා පාර්ලිමේන්තුව නියෝජනය කළ සියලුදෙනා අඩු වැඩි වශයෙන් රාජ්‍ය දේපළ ඉච්චාභංගත්වය සංවර්ධනය වෙලා තියෙනවා. මේගැන පුළුල් විග්‍රහයක් ඉදිරි ලේඛන වලින් බලාපොරොත්තු වන්න.

මංකොල්ල කෑම සිදුවූයේ ඍජුව හා වක්‍ර ලෙස ඉතිහාසයේ විවෘත ජනමාධ්‍ය සංස්කෘතියක් නොතිබීම නිසා බොහෝවිට ඍජුව හා වක්‍රව සිදුකළ මහජන දේපල මංකොල්ලකෑම් පිළිබඳව ලාංකික සමාජයේ වඩාත් නිරාවරණය වන පරිසරයක් තිබුනේ නැහැ. වර්තමානයේ ඇතැම් බෝතල් පත්තර හා විද්‍යුත් ජනමාධ්‍ය නිසා පාදඩ දේශපාලන අධිකාරින්ගේ මහජන දේපල සුරා කෑම වසාදමන අවස්ථා තියෙනවා. සංවර්ධන ක්‍රියාකාරකම් වලදී දේශිය හා විදේශීය වශයෙන් මන්ත්‍රිවරු හා ඇමතිවරු ලබාගන්නා කොමිෂ් මුදල් වලින් රටට හෙලිවන්නේ 10% ක් පමණයි. මෙහිදි අදාළ චෝදනාව දේශපාලඥයින්ට පමණක් සීමාවන්නේ නැහැ මහජන මුදල් උපයාශීලි ලෙස ගසාකන කම්කරුවා ගේ සිට අමාත්‍යාංශයේ ප්‍රධාන ලේකම් දක්වා මාපියාවක් රට තුළ ක්‍රියාත්මකයි. මේ සියලුදෙනා මහජන මුල්‍ය සම්පත් වලින් නිල නිවාස භුක්ති විඳිනවා. ඒ බව සැපයෙන ජලය, විදුලිය අදාල ගාස්තු පවා අමාත්‍යාංශ වලින් එකිනෙකා ගෙවා ගන්නා ක්‍රමවේදයක් සකස් කර තිබෙනවා. එය මහජන හිමිකම් වක්‍රව හා උපායශීලීව ඇමතිවරු ගසාකන ක්‍රමයක් කියලා කිව්වොත් වඩා නිවැරදියි.

රටේ ආර්ථිකයේ බිහිවී ඇති වපසරියක් තුළ දයාසාරි ජයසේකරගේ විදුලි බිල ඉලක්ක කරගෙන විදුලි බල අමාත්‍ය කාංචන විජේසේකර දයාසිරිට දේශපාලන මඩගැසීමේදී පෙරළා දයාසිරි එවැනි විදුලි බිල්පත් ගෙවීමට ඇති පාර්ලිමේන්තුව නියෝජනය කරන විදුලි බිල් නොගෙවූ කීප දෙනෙක් පිළිබඳ කරුණු හෙලිකලා. ඒ අනුව හරීන් ප්‍රනාන්දු 14,54173.63 ක් ගෙවන්න තියෙනවා. සෙහාන් සේමසිංහ 2,24649.72, එම්. ආතාවුල්ලා රුපියල් 9,8917.84, ක් කෙහෙලිය රඹුක්වැල්ල 10,10,389.01 ක්. මේ සියලුදෙනා වර්තමාන ජනාධිපති රනිල් වික්‍රමසිංහගේ ආණ්ඩුවේ අමාත්‍යවරු. මෙවැනි නිහඩව ගසාකන ක්‍රමවේද බහුතරයක් රටතුළ ක්‍රියාත්මකව ඇති පරිසරයක් තුල පොදු මහ ජනතාව සාගිනි තත්වයට තල්ලු වෙලා තියෙනවා.

පාදඩ දේශපාලනයේ මඩ ගසාගැනීම් නිසා මහජන මුදල් වංචා කිරිම පිළිබඳව ඇතැම් තොරතුරු කාන්දුවන සංස්කෘතිය අභිබවා යන ජනමාධ්‍ය සංස්කෘතියක් අද ලංකාවට අවශ්‍යයයි. රාජ්‍ය නිලධාරිනේගේ සුපිරි වංචාවලට අනුබල දීම් ආදිය හෙලිවන්නේ ඔවුන් එකිනෙකා අතර මඩගසා ගැනීමේ රටාවක් නැති නිසා. මේ පාදඩ තත්වය හමුවේ ලාංකික ප්‍රජාවගෙන් 80% පෝෂ්‍ය දායක ආහාර වේලක් ලබාගැනීමට නොහැකියාව මතුවෙලා තියෙනවා. මේ බව අනාවරණය කර ඇත්තේ ආර්ථික ස්ථායිකරණයට අදාළ කෙටි සහ මධ්‍යකාලීන කාලින වැඩසටහන් හඳුනා ගැනීමේ ජාතික සභා අනු කමිටුවයි. වැඩසටහන් හඳුනා ගැනීමේ මේ නිසා ඉදිරිකාලයේදී බෙලහීන දරු උපත් වසර 10 සිට මංදපෝෂණ තත්වය වර්ධනය වී තිබෙනවා. වර්තමාන ආර්ථික තත්වය හමුවේ අදාළ තත්වය උග්‍ර සමාජ ව්‍යවසනයකට තල්ලු වෙමින් තියෙනවා. දෛනික හා මාසික හා ආදායම් සහ ගෘහස්ථ වියදම් පිළිබඳ සමාජ සමීක්ෂණයකට පෙර වර්තමාන කාලීන සමාජ අවශ්‍යතාවය නම් ප්‍රජාවගේ නිරෝගි සෞඛ්‍ය හා

නිසි ආහාර පෝෂණය සඳහා කඩිනම් විකල්ප රජය මේ දක්වා ගෙන නැහැ. මේනිසා දවයින පුරා රාජ්‍ය දක්නට ලැබෙනවා. ඉන් රැකියා අවස්ථා නැතිවීමේ ඉච්චාභංගත්වයට පත්වීමේ බහුතරයක් විවිධ මානසික ව්‍යධීන් වලට ගොදුරු වෙමින් තියෙනවා. මේ පිළිබඳ පුළුල් පැති වලින් විග්‍රහ  බලපොරොත්තු වන්න.

සුමිත් කොඩිතුවක්කු